මහා බෝධි ප්‍රහාරයට පසුවදනක්

මට අවුරුදු 62 කට පෙර 1939 ජූලි මාසයේ ඉගෙනීම සඳහා කල්කටාවට යන ගමනේදී මගේ පළමුවැනි නැවතුම් පොළ වූයේ මදුරාසියේ පෙරම්බූර් නමැති උපනගරයේ පිහිටුවා තිබූ මහා බෝධි ආවාසයයි.

1920 දශකයේ අගදී අනගාරික ධර්මපාල තුමා විසින් මේ කුඩා ඉඩම මිලයට ගෙන එහි අවාසයක් හා යාබද මඩුවක ප්‍රාථමික පාසලක් ද ආරම්භ කරන ලදී.

මේ කුඩා මධ්‍යස්ථානය භාරව කටයුතු කළේ පූජ්‍ය නිල්වත්තේ සෝමානන්ද හාමුදුරුවෝ ය. දෙමළ භාෂාව හොඳින් දැන්නා උන්වහන්සේ 1930 ගණන් වලදී ධම්මපදයේ දෙමළ පරිවර්තනයක් ද පළ කළහ.

1939 පටන් අඩසිය වසක් ගතවන තුරු මදුරාසියේ මහාබෝධි මධ්‍යස්ථානය සමග මට තිබුණේ ඉතා කිට්ටු සම්බන්ධතාවකි.

1950 දශකයේදී මහා බෝධිය පෙරුම්බූර්වලින් ඉවත් කොට පිහිටුවන ලද්දේ ජනාකීර්ණ එග්මෝර් දුම්රිය පොළ අසල අලුතින් මිලදී ගන්නා ලද මන්දිරයක ය. පසුගිය සතියේ තමිල්නාඩුවේ අන්තවාදී දේශපාලන පක්ෂ විසින් මෙහෙයවන ලද කුපිත පෙළපාළි කරුවන් ප්‍රහාරයක් එල්ල කළේ මේ මහා බෝධි විහාරයටය.

එග්මෝර් මහාබෝධි විහාරයට එල්.ටී.ටී.ඊ. හිතවාදී කුපිත පෙළපාළිකරුවන් පහරදුන් පළමු අවස්ථාව මෙය නොවේ.

මා මදුරාසියේ (චෙන්නායි) නියෝජ්‍ය මහ කොමසාරිස් පදවිය දැරූ 1983 - 1985 කාලය තුළ මහාබෝධියට මැර ප්‍රහාර කිහිපයක් එල්ල විය. එක් මැර ප්‍රහාරයක් එල්ල කරන ලද්දේ තමිල්නාඩුවේ ශිවකාසි කොට්ඨාසය නියෝජනය කරන වයි. කෝපාල්සාමි (වයිකෝ) මෙහෙයවූ පෙළපාළි කරුවන් විසිනි. මේ කාලයේ දී මහාබෝධිය වසා තැබීමට අපට සිදු විය.

1983 කළු ජූලියේදී මහාබෝධියට මැරප්‍රහාර කිහිපයක් එල්ල විය. ඒවා නැවතුණේ තමිල්නාඩු රජයෙන් සන්නද්ධ පොලිස් කණ්ඩායමක් විසින් එතැන ආරක්ෂාව සඳහා යොදනු ලැබීමෙන් පසුවය.



ඉන්දියාවේ නිවපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

එදා තමිල්නාඩුවේ ශ්‍රී ලංකා විරෝධී අන්තවාදීන්ගේ ප්‍රධාන ඉලක්කය වූයේ මදුරාසියේ මහාබෝධිය හා සංඝයා වහන්සේලාය. එක් සිද්ධියක් පමණක් ගෙන හැර පාන කැමැත්තෙමි.

ගයාවේ සිට මදුරාසියට දුම්රියෙන් වැඩම කළ නිල්වත්තේ සෝමානන්ද හාමුදුරුවෝ මදුරාසි සෙන්ට්‍රල් දුම්රිය පොළේ සිට එක්මෝර් මහාබෝධිය දක්වා ගමන්කිරීම සඳහා සයිකල් රික්ෂෝ අංගනයට ගිය විට උන්වහන්සේ වට කර ගත් රික්ෂෝ කරුවෝ උන්වහන්සේට අඩන්තේට්ටම් කරන්නට පටන් ගත්හ. එක් රික්ෂෝකරුවෙක් සෙරෙප්පුවෙන් පහර දුන්නේය.

මේ අවස්ථාවේ දී එතැනට පැමිණියේ පොලිසිය නොවේ. දුම්රිය පොළ අවට ප්‍රදේශයේ නිතර ගැවසෙන ඇතැම්විට ටැක්සියක් ද පදවන හැඩි දැඩි තරුණයෙකි. ඔහු එතැනට ආවේ කලහකරුවන්ට තර්ජනය කරමිනි.

නිමේෂයකින් ඔවුන් සියල්ල පළවා හැර දැමූ හැඩි දැඩි තරුණයා සෝමානන්ද හිමියන් කැටුව ගොස් ටැක්සි රියකට නංවා උන්වහන්සේ එග්මෝර් දක්වා කැටුව යන ලෙසත්, මුදල් අය නොකරන ලෙසත් ටැක්සි රියදුරාට නියෝග කළේය.

"නෑ..... නෑ..... මං සල්ලි ගෙවන්නං....." හාමුදුරුවෝ පැවසූ විට සිනාවක් පා තරුණයා "ඉල්ලෙයි .....ඉල්ලෙයි..... බුද්ධං සරණං ගච්ඡාමි" කියමින් හාමුදුරුවන්ට යළිත් වැන්දේය. තවත් තරුණයෝ කිහිප දෙනෙක් පැමිණ හාමුදුරුවන්ට නමස්කාර කළහ. මේ පිරිස අම්බෙඩ්කාර් අනුගාමික (නව බෞද්ධයන්) බව සොමානන්ද හිමියන් වටහා ගත්තේ එවිටය.

නිල්වත්තේ සෝමානන්ද හිමියෝ මදුරාසි එග්මෝර් මධ්‍යස්ථානයෙන් පිටත්ව ගොස් සාරනාථයේ මහාබෝධි මධ්‍යස්ථානය භාරව ක්‍රියා කළහ. ඒ කාලයේ උන්වහන්සේ ඉන්දීය රජය විසින් බුද්ධගයා පාලක මණ්ඩලයේ නිත්‍ය පාලක මණ්ඩල සාමාජිකයකු වශයෙන් පත් කරන ලදී.

1983 දී හා 1984 දී මහාබෝධි විහාරයට එල්ල වූ ප්‍රහාරවලට සම්බන්ධ වූයේ අන්තවාදී සුළු දෙමළ කණ්ඩායම්වල පිරිස පමණක් නොවේ. ප්‍රාන්තයේ ප්‍රබලම දේශපාලන පක්ෂ දෙක වූ කරුණානිධිගේ ඩී. එම්. කේ. සහ ඇම්. ජී. රාමචන්ද්‍රන්ගේ අන්නා ඩී. ඇම්. කේ. යන පක්ෂ දෙක ප්‍රසිද්ධියේට ඊට සහාය දැක්වූ අතර තම පාක්ෂිකයන් එම පෙළපාළියට සම්බන්ධවීම වැළැක්වීම කොංග්‍රස් පක්ෂයේ නායකත්වයද උනන්දු නොවූ බව සඳහන් කළ යුතුය. එසේ වුවද රජීව් ගාන්ධි ඝාතනයෙන් පසු ඉන්දියාවේ අනෙක් ප්‍රදේශවල මෙන්ම තමිල්නාඩුවේද එල්. ටී. ටී. ඊ. විරෝධී හැඟීම් පැතිරගියේ නිමේෂයෙනි. ඒ හැඟීම් අදත් වෙනස් වී නැත.

එසේ නම් මේ දඩබ්බර ක්‍රියාවන්හි යෙදෙන්නෝ කවරහුද?

"නාන්කමිසාර්" හෙවත් "අපි දෙමළ" ව්‍යාපාරය ඇරඹුණේ ඉන්දියාවට නිදහස ලැබුණාදා පටන්ය. එම ව්‍යාපාර පැහැ හැග්ගේ යටත් විජිත යුගයේදීම දියත් කරන ලද පෙරියාර් රාමසාමි නයික්කර්ගේ -ද්‍රවිඩ කසගම" ව්‍යාපාරයේ අංකුරයක් ලෙසිනි.

පෙරියාර් රාමසාමි නයික්කර් ද්‍රවිඩ කසගම් ව්‍යාපාරය ඇරඹුවේ වින්ධ්‍ය කඳුකරයෙන් දකුණේ පිහිටි ආන්ද්‍ර, තමිල්නාඩු, කර්නාටකා හා කේරළ යන ද්‍රවිඩ ප්‍රාන්ත හතර එකතු කොට "ද්‍රවිඩ දේසම්" නමින් ස්වෛරී රාජ්‍යක් පිහිටුවීම අරමුණු කරගෙනය. එහෙත් ඔහුගේ මේ "උමතු න්‍යායයට" නිදහස් සටනින් පන්නර හී සිටි සකල ද්‍රවිඩ ජනතාවගෙන් ලැබුණේ අවඥාවක් පමණි.

කෙසේ වුවද තමිල්නාඩු ප්‍රාන්තයේ චිත්‍රපට කර්මාන්තයේ යෙදුණු අයද ඇතැළුළුව සීමිත කොටසක අනුගාමිකයන් එක්කාසු කරගැනීමට ඔහු සමත් විය. අන්තිමේදී මේ පිරිස් ද -ද්‍රවිඩ දේසම් මිරිගුව" අතහැර දමා ප්‍රාන්තවලට වැඩි බලතල සඳහා උද්ඝෝෂණය කරන දේශපාලන පක්ෂයක් නිර්මාණය කළහ.

එම පක්ෂයේ නායකයා වූයේ සී. එන්. අන්නදුරේය. එහි නම ද්‍රවිඩ මුන්නේසර කසගම වේ.

1967 ප්‍රාන්ත මැතිවරණයේදී අන්නදුරේගේ ඩී. එම්. කේ. පක්ෂය තමිල්නාඩු ප්‍රාන්තයේ බලය අල්ලා ගත්තේය. එම මැතිවරණයේ දී ඔවුන් කොන්ග්‍රස් පක්ෂයට විරුද්ධව ඉදිරිපත් කළ ප්‍රධාන සටන්පාඨ දෙක මොනවාද?

1. කොන්ග්‍රස් පක්ෂය ඉන්දියාවේ රාජ්‍ය භාෂාව හින්දි භාෂාව වීමට විරෝධය පෑම.

2. ප්‍රාන්ත මහ ඇමති බක්තවත්සලම් සිරිමා ශාස්ත්‍රී ගිවිසුම අනුමත කිරීමෙන් ලංකාවේ දෙමළ ජනයාගේ ආත්ම ගෞරවයට අවමන් කිරීම.

අන්නදුරෙයිගේ මරණින් පසු ඩී. එම්. කේ. පක්ෂය දෙකඩ වී ඇම්. ජී. රාමචන්ද්‍රන් කණ්ඩායම සමස්ත ඉන්දීය අන්නා ඩී. ඇම්. කේ. පක්ෂය නමින් තවත් පක්ෂයක් පිහිටුවා ගන්නා ලදී.

1967 සිට මේ දක්වා අඩසියවසකට ආසන්න කාලය තුළ තමිල්නාඩු ප්‍රාන්තයේ ආණ්ඩු බලට ලබාගත්තේ මේ පක්ෂ දෙක මාරුවෙන් මාරුවට ය. ඒ අතරම සෑම සමස්ත ඉන්දීය පාර්ලිමේන්තු මැතිවරණයකදීම ප්‍රධාන පක්ෂ බලවේග දෙක මේ පක්ෂ දෙක අතර සම්මුතියක් ඇති කර ගැනීම විශේෂයෙන් සැලකිය යුතුය. එම නිසා ලංකාවේ පක්ෂ ගැන ද දිල්ලියේ මහ රජය සමග "හෙට්ටු කිරීමට" මේ පක්ෂවලට අවස්ථාවක් ලැබෙන්නේය.

1950 දශකයේදී මහා බෝධිය පෙරුම්බූර්වලින් ඉවත් කොට පිහිටුවන ලද්දේ ජනාකීර්ණ එග්මෝර් දුම්රිය පොළ අසල අලුතින් මිලදී ගන්නා ලද මන්දිරයක ය. පසුගිය සතියේ තමිල්නාඩුවේ අන්තවාදී දේශපාලන පක්ෂ විසින් මෙහෙයවන ලද කුපිත පෙළපාළි කරුවන් ප්‍රහාරයක් එල්ල කළේ මේ මහා බෝධි විහාරයටය.

දැන් අපි යළිත් මුලින් සඳහන් කළ "නාන් තමිසාර්" හෙවත් "අපි දෙමළ" ව්‍යාපාරයට අවධානය යොමු කරමු.

මේ ව්‍යාපාරයට ඇත්තේ එකම අරමුණකි. එනම් ලෝකයේ කොතැනක හෝ ස්වෛරී දෙමළ රාජ්‍යයක් පිහිටුවිය යුතුය. ඉන්දීය ව්‍යවස්ථාවේ ශක්තියක් ප්‍රාන්ත අතර ආර්ථික හා සාමාජීය සම්බන්ධය දැඩිකමත් නිසා එය තමිල්නාඩුවේ සිදුකළ නොහැකි බව ඔවුනු දනිති. එම නිසා දෙමළ ජාතික ධජය එසැවීමටත් දෙමළ ජාතික ගීය ගැයීමටත් රටක් අවශ්‍ය විය.

මේ පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා ඔවුහු දේශපාලන පක්ෂයක් වශයෙන් ක්‍රියා නොකරති. ඔවුන් තම සාමාජිකයින්ට කියන්නේ ප්‍රාන්තයේ සියලුම දේශපාලන පක්ෂ තුළට කණ්ඩායම් වශයෙන් ඇතුළු වී ප්‍රචාරයේ යෙදෙන ලෙසය. මේ ක්‍රියාමාර්ගය ඉඳහිට ප්‍රතිඵලගෙන දුන්නද එය ස්ථාපිත යථාර්ථයක් වන ලකුණක් නැත.

පසුගිය සතියේ පවත්වන ලද කලහකාරී පෙළපාළිවලින් පසු අත්අඩංගුවට ගත්තා වූ පිරිසෙන් වැඩිදෙනා "නාන් තමිසාර්" ව්‍යාපාරයට සම්බන්ධ බව පොලිස් වාර්තා වලින් පැහැදිලි වන බව ද කියැවේ. ■

Professional Tutoring

English - Up to Year 9

Mathematics - All Year Levels

Maths Methods/General maths - Year 11

Maths Methods/ Specialist Maths/ Further Maths - Year 12

Selective School Exams

Scholarship Exams

Qualified Tutors
Over 17 Years experience in Australia
Produced excellent results
Individual or Small group classes

Contact
03 9470 8295
0409 854 597
email - hemantha2020@yahoo.com.au
induminik@yahoo.com.au

හේමන්ත දේවේන්ද්‍ර
නෙරංජනා කුඩලිගම
Home Visits possible